// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2055/18 – 2018 ජනවාරි මස 24 වැනි බදාදා – 2018.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත

අතිගරු ජනාධිපතිතුමාගේ එකඟත්වය පරිදි, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 36 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන නියෝගය.

**රිෂාඩ් බදියුදීන්,**
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2018 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

**නියෝගය**

අංක 1773/36 හා 2012 අගෝස්තු 30 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් අවසන් වරට සංශෝධනය කරන ලද, අංක 508/07 හා 1988 ජුනි මස 02 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ පනවන ලද නියෝග වහාම ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන අයුරින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

දෙවන උපලේඛනය

| | | ගෙවිය යුතු ගාස්තු *(Vat රහිත)* |
|---|---|---|
| 1. | ටෙන්ඩර්කරු හෝ ටෙන්ඩර්කරු සඳහා හෝ වෙනුවෙන් කටයුතු කරන අනු නියෝජිත උප නියෝජිත, නියෝජිත හෝ නාමිකයා ලියාපදිංචි කරනු ලැබීම සඳහා අයදුම් කිරීම | රු. 2,000.00 |
| 2. | පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමට අයදුම් කිරීම | රු. 10,000.00 |
| 3. | ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අයදුම් කිරීම | රු. 2,000.00 |
| 4. | පොදු කොන්ත්‍රාත්තුවක් නැවත ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කිරීම | රු. 10,000.00 |

02 - 294

1A – PG3899 – 407(2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*